## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය :-** : පෙරදිග සංගීතය **අදාළ සතිය :-** ජනවාරි 3 වන සතිය

**2.පාඩම/ ඒකකය:-**.4.1 .කෝකිල වන්නම ගායනා කරමු.

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

1* **කියවීම් පත්‍රිකාවේ ඇති සටහන පිටපත් කර ගන්න.**
2* **දී ඇති ඉගෙනුම් ආධාරක මඟින් වන්නම ශ්‍රවනය කරන්න.**
3* **වන්නමේ තානම ගායනා කරන්න.**
4* **වන්නමේ නාද මාලාව හුරුවන තෙක් නැවත නැවත ගායනා කරන්න.**
5* **තානම තිත් දෙකකට ගැයෙන බව අවබෝධ කර ගන්න.**
6* **තානමේ නාද මාලාව අනුව කවිය ගායනය කරන්න.**

**කියවීමේ පත්‍රිකාව**

රත්නපුර, කලවාන, කුරුවිට, පැල්මඩුල්ල, නිවිතිගල, හිදැල්ලන, බලංගොඩ ආදි සබරගමු පළාතට ආවේණික නැටුම් සම්ප්‍රදායයේ එන වන්නම් සබරගමු වන්නම් වේ.

දෙවියන් හා සතුන් පිළිබඳ වර්ණනා ඇතුළත් ගීත විශේෂයකි. විනෝදය සඳහා පැවැත්වෙන මෙම සබරගමු වන්නම් සඳහා වාදනය කරනු ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දවුල යි. සබරගමු වන්නමක දී දවුල් පදය, තානම, කවිය, කලාසම, අඩව්ව වශයෙන් කොටස් පහකින් සමන්විත වේ.

නාමික ව සබරගමු වන්නම් 24ක් වුවත් භාවිතයේ පවතින්නේ වන්නම් 18ක් පමණි. එය සංස්කරණය කරන ලද්දේ කලවානේ ධර්මාලංකාර අතපත්තුමුදලි බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

විනෝදය සඳහා පැවැත්වෙන සබරගමු වන්නම් සඳහා වාදනය කරනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දවුල යි. සමන් දේවාල පෙරහැරේ දෙවියන් උදෙසා සබරගමු වන්නම් නර්තනය කළ බව පොතපතෙහි සඳහන් වේ.

උදාහරණ වශයෙන් සබරගමු වන්නම් කිහිපයක් පහත දක්වා ඇත. ගාහක, උරගා, මයුරා, තිසරා, කෝකිල, ආනන්ද, අනිලා, මණ්ඩුක, විරාඩි, කදම්භපක්ෂි

ස්වර ක්ෂේත්‍රය පටු ය. දේශීය තිත් ක්‍රමය මත ගොඩ නැඟී ඇත. මෙම වන්නම්වල එන ගී තනු මිහිරි බවින් හා ලයාන්විත බවින් ඉහළ මට්ටමක ඇත.

සබරගමු වන්නම් ශාන්ති කර්මයන්ගෙන් බැහැර වූ නර්තනාංගයක් වශයෙන් හැඳින්විය හැකි ය.

කෝකිල වන්නම තාල රූප දෙකකින් ගැයේ. මැදුම් තනි තිත හා දෙසුළු මැදුම් තුන්තිත අනුව ගායනය කෙරේ.

## කෝකිල වන්නම

තානම :-

තාන තනා තන තනෙනා - තෙතන තනා තන තනෙනා

තාන තනා තම්දෙනා - තානෙන තම් තෙතන තනා තම්දෙනා

කවිය

කොහොව් යනා හඬ නඟනා - මියුරු මනා දන සවනා
පරපුටු වෙසෙසින්නේ වසන්නේ - මහවන ගස් මුදුනේ

රිටු විමනා බිජු ලම්නා - බහු නදනා රකෙන මෙනා
ලොකු වී නද දෙන්නේ - ඔවුන්ගේ එම විට බැට කන්නේ

රුව සමනා උවත් මනා - ඉසි වඩනා රිටු නොමිනා
රිටු පරපුටු හටනේ - දෙවන්නේ නිදසුන් යස රුවනේ

ලොව දුර්ජනා ගතිය මනා - මෙම හට නාලොව තිබෙනා
අසනුය වියතුන්ගේ ගයන්නේ මේ මනහර වරුණේ

දවුල් පදය :-

| | |
|---|---|
| ජි ං ත | ත ක ට |

| | | | | | |
|---|---|---|---|---|---|
| කු ද ත් | තක් | කි ට | ත ක ට | ජි ං | ත ක |

තානම :-

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නි - ස | රි ග රි | ස නි ස | රි ග රි | රි ම ග | රි ග රි | ස - ස ස ස ස |
| තා ς න | ත තා ς | ත න ත | තෙ තා ς | තෙත න | ත තා ς | ත න ත තෙ තා ς |
| + + + | නි නි | ස නි | ස ස - | රි ම | ග රි | ගරි ස - |
| + + + | තා ς | න ත | තා ς ς | ත මි | දෙ ς | තාς ς ς |
| | - - | ස - | ස රි - | ස - | නි - | - - - |
| | ς ς | තා ς | තෙ තς | ත මි | ς ς | ς ς ς |
| | නි නි | ස නි | ස ස - | රි ම | ග රි | ගරි ස - |
| | තෙත | න ත | තා ς ς | ත මි | දෙ ς | තාς ς ς |
| | - - | - - | - - - | - - | - - | නි - ස |
| | ς ς | ς ς | ς ς ς | ς ς | ς ς | තා ς න |

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය
- 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය අතිරේක කියවීම් පොත
- සිංහල නර්තන කලාව- මුදියන්සේ දිසානායක මහතා
- නර්තනය - බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ මිය
- **You tube - [https://www.youtube.com/watch?v=spM3gunfTrk&t=178s](https://www.youtube.com/watch?v=spM3gunfTrk&t=178s)**

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

සබරගමු වන්නම් ගායනය කරයි.
සබරගමු වන්නම් වල ස්වභාවය අධ්‍යයනය කරයි.
මෙම සම්ප්‍රදායේ වන්නම් ගයමින් සතුට ප්‍රකාශ කරයි.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය